www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මහා බලවතුන් දේශගුනය ලාභ අල්තාරයට පුද දෙයි

## Great powers sacrifice climate on the altar of profit

2009 දෙසැම්බර් 21

ලෝකය පුරා විද්‍යාඥයින්, විනාශයක් වැලැක්වීම පිනිස මිනිසුන් විසින් ඇතිකරන ලද කාලගුන විපර්යාසය නැවැත්වීමට වේගවත් ශක්‍ය වැඩපිලිවෙලක් අවශ්‍ය බවට එකඟ වී සිටිති. ඉදිරි දශකයන් තුල බිලියන ගනනින් මහජනතාවගේ ජීවන කොන්දේසි මුහුදු මට්ටම ඉහලයාම, සුලි කුනාටු, ගංවතුර, නියං සහ බවභෝග විනාශවීම මගින් තර්ජනයට ලක්වනු ඇත.

ගෝලීය උනුසුම් වීමට විසඳුමක් සෙවීමේ හදිසි අවශ්‍යතාව නොතකමින්, පසුගිය සතියේ කෝපන්හේගන්හි පැවති ලෝක කාලගුන සමුලුවේදී රටවල් 193 ක නියෝජිතයින් ගෝලීය හරිතාගාර වායු මට්ටම පහත හෙලීමට කිසිදු පලදායී පියවරක් ගැනීම පිලිබඳ එකඟතාවයකට පැමිනීමට සම්පූර්නයෙන්ම අපොහොසත් විය. පාරිසරික කන්ඩායම් සහ මාධ්‍යයේ පලල් පාර්ශ්වයන් විසින් සමුලුව තක්සේරු කරනු ලැබුවේ විනාශකාරී සිද්ධියක් ලෙසය. "කෙතරම් විනාශයක්ද" යනුවෙන් ජර්මානු පුවතපතක් වන ඩර් ස්පීජල් (*Der Spiegel*) පුවත්පතේ වෙබ් අඩවියේ සමුලුව පිලිබඳ වාර්තාව ඇරඹුනි. සුදෙච්ෂි ශිටන්ග් (*Süddeutsche Zeitung*) ලීවේ "ලැජ්ජාව, පුහු සෝෂාව සහ ව්‍යසනය" යනුවෙනි.

සාකච්ඡා වලින් සති දෙකකට පසුව, සමුලුවේ නියෝජිතයින් විසින්, බැඳීම් විරහිත, යම්තම් පිටු තුනකින් සමන්විත අවසාන වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. එයින් ඉදිරිපත් කරනුයේ ගෝලීය උනුසුම වේගවත් වීමේ අවදානම සමග ගනුදෙනු කිරීමට කිසිසේත්ම ප්‍රමානවත් නොවන පොදුවේ විද්‍යාඥයින් විසින් හඳුනා ගන්නා ලද ඉලක්කයන් ය.

ගිවිසුමට විරුද්ධ වූ කුඩා රටවල් කීපයක් දොර වැසූ ඇතුල් සාකච්ඡා තුලින් එකට ඒකාබද්ධ කරගන්නා ලදී. අවසානයේදී, සමුලුවට සහභාගී වූවන් මෙම ගිවිසුම පිලිගැනීමට එකඟ නොවූ අතර ඒ වෙනුවට "කෝපන්හේගන් ගිවිසුම සැලකිල්ලට ගැනීමට කැමැත්ත පල කරන ලදී".

එක්සත් ජනපද ජනාධිපති බරක් ඔබාමා, චීන අග්‍රාමාත්‍ය වෙන් ජියාබාවෝ, ජර්මානු චාන්සලර් ඇන්ජෙලා මර්කල්, බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය ගෝර්ඩන් බ්‍රවුන්, සහ ප්‍රන්ස ජනාධිපති නිකොලස් සාර්කෝසි ඇතුලු රාජ්‍ය ප්‍රධානීන් සියයක පමන සහභාගීත්වයෙන් පසුගිය දින දෙක අතරතුර සිදු වූ සාකච්ඡාවෙන් මෙම එකතැන පල්වීම බිඳ දැමීමට කිසිවක් සිදු වූයේ නැත. "අද මෙහි සිදු වූ කිසිවකට එක්සත් ජනපදය නීත්‍යානුකූලව නොබැඳෙනු ඇති" බවට පවසමින් එක්සත් ජනපද දක්ෂිනාංශික දේශපාලන කවයන් දිරි ගන්වමින් නැවත වතාවක් අවසාන එකඟතාවය සඳහා පරාමිතීන් අතුරනු ලැබුවේ ඇමරිකානු ජනාධිපති විසිනි. එක්සත් ජනපද ස්වයං අභිලාෂය පිලිබඳ ඔබාමාගේ ප්‍රකාශනය අනෙකුත් ප්‍රධාන කාර්මික ජාතීන් විසින් ද ප්‍රතිරාවය නගන ලදී.

අවසාන විග්‍රහයේදී, එය කිසිදු එකඟතාවයකට පැමිනීම වලක්වාලූ, සුවිශේෂිතව ම එක්සත් ජනපදය, චීනය, සහ යුරෝපා සංගමය යන ප්‍රධාන ආර්ථික බලයන්ගේ ආක්‍රමනශීලී අභිලාෂයන් විය. කෝපන්හේගන්හි ගැටුම් සහගත දෙසතියට ලෝක කාලගුනය සහ පරිසරය බේරාගන්නේ කෙසේද යන්නට වඩා මූලෝපායික අවශ්‍යතා, වෙලඳ අර්බුද, සහ තරගකාරී සතුරන් සමග කිරීමට බොහෝ දේ තිබුනි.

ප්‍රමුඛ පෙලේ කාර්මික රටවල් සිය කාබන්ඩයොක්සයිඩ් ($CO_2$) විමෝචනය සම්බන්ධ ප්‍රශ්නයට ආමන්ත්‍රනය කරනු ලැබුවේ සම්පූර්නයෙන්ම ඒ ඒ පාලක පන්තිවල ආර්ථික සහ මූලෝපායාත්මක ආස්ථානයෙනි. සත්‍ය වශයෙන්ම, ඩැනිෂ් අගනුවර සාකච්ඡා පිටුපස පැවති භූ මූලෝපායාත්මක ප්‍රශ්න ඉරාකයේ මෙන්ම ඇෆ්ඝනිස්තානයේ යුද්ධ සහ තවත්

බොහෝ ජාත්‍යන්තර අර්බුද ඇතිකරනු ලැබූ ඒවාටම සමාන වේ.

ජාත්‍යන්තර බලශක්ති ඒජන්සියේ ගනන් බැලීමට අනුව, ලෝකය පුරා බලශක්ති ඉල්ලුම ඉදිරි වසර 20 ඇතුලත සියයට 50 කටත් වැඩිවනු ඇත. රටක ආර්ථික ශක්තිය සැලකිය යුතු තරමින් එහි බල ශක්ති සම්පත් සඳහා පවත්නා ප්‍රවේශය මත රඳා පවතිනු ඇත. එක්සත් ජනපදය ලෝකයේ වඩාත්ම පලදායී තෙල් සහ ගෑස් සංචිත කෙරේ සිය අධිකාරිත්වය ආරක්ෂාකරගැනීම ඉලක්ක කර ගනිමින් යුද්ධ සඳහා ඩොලර් ට්‍රිලියනයක් පමන ආයෝජනය කොට ඇත්තේ එහෙයිනි.

පර්සියන් ගල්ෆ් කලාපය තුල සහ ඇෆ්ගනිස්තානය - මධ්‍යම ආසියාවට පවත්නා ප්‍රවේශ මාර්ගය - තුල සිය මිලිටරි සහභාගිත්වය ද සමගින් එක්සත් ජනපදය ආරක්ෂා කරමින් සිටිනුයේ තමන්ගේම ශක්ති අවශ්‍යතාවයන් පමනක් නොවේ. ඔවුන්, මැද පෙරදිගින් ආනයනය කරනු ලබන බලශක්තිය මත දැඩිව රඳා පවතින යුරෝපයේ සහ ආසියාවේ සිය ප්‍රතිමල්ලවයන්ට පීඩනය යෙදවීමේ වැදගත් ලීවරයක් ලබා ගැනීමට යත්න දරයි. විකල්ප තාක්ෂනයන්ගේ වර්ධනය තවමත් ලෝකයේ ශක්ති පරිභෝජනයෙන් සියයට 80 කට ආසන්න ප්‍රමානයක් සපුරා ගන්නා පොසිල ඉන්ධන මත රඳා පැවැත්ම අඩුකරනු ඇත. පරිසර දූෂනයෙන් තොර තාක්ෂනවේදයන් සොයා ගැනීම හා ක්‍රියාත්මක කිරීම සිය සතුරන් වඩාත් ස්වාධීන කිරීමට උදව් කාරක වන බැවින් ඒ වෙනුවෙන් බිලියන ගනනින් වැය කිරීමට එක්සත් ජනපදයට ඇත්තේ කුඩා අභිලාෂයකි.

පොසිල ඉන්ධන මත රඳා පවත්නා එම බලශක්ති කන්ඩායම් සහ කර්මාන්තයන්ගේ **වටලෑම** මගින් අමතර පීඩනයක් යොදවා තිබේ. $CO_2$ විමෝචනයේ කවර හෝ අඩු කිරීමක් ඔවුන් විසින් සලකනුයේ වියදම් සාධකයක් ලෙස සහ ලාබ කපාහරිමින් ඔවුන්ගේ තරගකාරිත්වයට ඇති කෙරෙන බාධකයක් ලෙසයි. ඔවුන් නැවත නැවතත් සිය බලය භාවිතා කොට ඇත්තේ ඇමරිකානු කොන්ග්‍රසය තුල සිදු කෙරෙන ඕනෑම $CO_2$ විමෝචන ක්‍රියාවක් අඩපන කිරීමට ය.

අවසාන වශයෙන්, දැනට ලෝකයේ බලශක්තියෙන් හරි අඩක් පරිභෝජනය කරනු ලබන ප්‍රධාන කාර්මික රටවල්, සිය කාර්මීකරනයට සමානව ම ශක්ති පරිභෝජනය වැඩිකර ගනිමින් පවත්නා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට එරෙහි අවියක් ලෙස කාලගුන විපර්යාසය පිලිබඳ ප්‍රශ්නය භාවිතා කරමින් සිටී.

කෝපන්හේගන්වල දී එක්සත් ජනපදය තදින්ම ඉල්ලා සිටියේ මතුවෙමින් සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල්, විශේෂයෙන්ම චීනය, සිය $CO_2$ විමෝචනය ස්ථාවර සහ සහතික කල හැකි පහත හෙලීම් සඳහා තමන්ම කටයුතු කල යුතු බවයි. දිලිඳු ජාතීන් 77 නියෝජිතයින් දැඩිව ම මෙම බිය වැද්දීමේ උත්සාහයට විරුද්ධ විය.

විශේෂිතව ම සිය කාර්මික ප්‍රසාරනය බැර කර්මාන්තය මත පදනම් වූ චීනය, තම පාරිසරික ක්‍රියාදාමයන් හි තහවුරුභාවය පිලිබඳ කවර හෝ විමර්ශනයක්, අනුමත කල නොහැකි ජාතික ස්වාධිපත්‍යය උල්ලංඝනය කිරීමක් ලෙස සලකමින් ප්‍රතික්ෂේප කලේය. චීනය තර්ක කලේ අලුතින් සංවර්ධනය වන රටවලට වඩා පැරනි කාර්මික ජාතීන් ගෝලීය උනුසුම් වීමට වගකිව යුතු බවයි. ඔවුහු ඉන්පසු සංවර්ධනය වෙමින් පවතින රටවලට සිය $CO_2$ විමෝචනය අඩුකර ගැනීම සඳහා මූල්‍යමය ආධාර ඉල්ලා සිටියහ. කාබන් විමෝචන සීමාවන්, වෙලඳ බාධක පැනවීම සඳහා තර්කයක් බවට පත්වීමේ අවදානම ගැනද චීනය තම උත්සුකය ප්‍රකාශකොට තිබුනි. මෙය එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතයේ පාර්ශ්වයන් විසින් ප්‍රවර්ධනය කරන ලද ආස්ථානයකි.

සිය කොටස වෙනුවෙන්, එක්සත් ජනපදය පොරොන්දු වී තිබුනේ 2005 ට සාපේක්ෂව 2020 වන විට සිය $CO_2$ විමෝචන ප්‍රතිශතය සියයට 17 කින් පමනක් අඩුකරන බවටය. එක්සත් ජනපදය කිසිදා අනුමත නොකල 1997 කියෝතෝ එකඟතාවයෙන් ස්ථාපිත කරනු ලැබූ මට්ටම් වලට අනුව, මෙය නියෝජනය කරනුයේ සියයට 4 කටත් අඩු ප්‍රමානයක පහත හෙලීමකි. යුද්ධය සහ සමාජ ගැටලු සම්බන්ධයෙන් මෙන්ම, ඔබාමාගේ සහ ඔහුගේ පූර්වගාමී ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් ගේ කාලගුන ප්‍රතිපත්ති අතර වෙනසක් නොමැති තරම්ය.

එක්සත් ජනපදයට සහ චීනයට ප්‍රතිකූලව, යුරෝපානු රටවල්, විශේෂයෙන්ම ජර්මනිය සහ ප්‍රන්සය වගකිවයුතු සහ පාරිසරික සවිඥානික රටවල් ලෙස පෙනී සිටීමට යත්න දැරූ බවක් පෙනෙන්නට තිබුනි. යුරෝපා සංගමය ප්‍රකාශකලේ, එය, මහද්වීපයේ $CO_2$

විමෝචනය සියයට 20 ක් අඩු කිරීමේ පූර්ව සහතිකය වෙනුවට 2020 වන විට සියයට 30 කින් පමන පහත හෙලීමට කටයුතු සූදානම් කොට ඇති බවයි. ඒ හැර මුලුවේ පලමු සතිය ඇතුලත ඉදිරි වසර තුන සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට යුරෝ බිලියන 7.2 (•7.2)ක් ලබා දීමට යුරෝපා සංගමය පොරොන්දු විය.

කෙසේ වුවද, යුරෝපා සංගමයේ සාමාජික රටවල් ඔවුන්ගේ ආර්ථික අභිලාෂයන් වර්ධනය කරගැනීමට දක්වන උනන්දුව එක්සත් ජනපදය සහ චීනය තරම්ම වේ. බහුතරයක් විද්‍යාඥයින් $CO_2$ විමෝචනයේ සියයට 30 ක පමන අඩුවීම ගෝලීය උනුසුම් වීම සෙල්සියස් අංශක දෙකකටවත් සීමා කිරීමට ප්‍රමානවත් නොවන බවට එකග වේ. ඊටත් වඩා, යුරෝපා සංගම් රාජ්‍යයන් සිය $CO_2$ සීමාකරනය සකස් කොට ඇත්තේ එක්සත් ජනපදය සහ චීනයේ අඩුකිරීම් සමග සංසන්දනාත්මක අයුරිනි.

පොසිල බල ශක්ති සංචිත ඌන සහ බොහෝ සෙයින් ඒවා ආනයනය මත රඳා පවතින ජර්මනිය සහ ප්‍රන්සය විකල්ප තාක්ෂනවේදයන් වැඩිදියුනු කිරීම හරහා සිය පරායත්තතාව අඩු කිරීමට බලාපොරොත්තුවේ. මේ තත්ත්වය මත ඔවුන් සිටිනුයේ එක්සත් ජනපදය සමග ගැටුමකය. ඒ සමග ම ඔවුන් තම නවීන තාක්ෂනවේදයන් සඳහා වෙලඳ පොල දිනාගැනීම පිලිබඳව ගනන් බලමින් සිටී.

මේ අතර තුර, කාබන් නය වෙලඳ පද්ධතිය මේ වන විටත් දැවැන්ත මුදල් උපයන ව්‍යාපාරයක් බවට පත්ව තිබේ.

කෝපන්හේගන්හි කාලගුන සමුලුව ඔප්පු කර පෙන්වනුයේ, කාලගුනික විපත වලක්වාලීමට විද්‍යාත්මකව මග පෙන්වූ සහ ජාත්‍යන්තර වශයෙන් සම්බන්ධීකරනය කරනු ලැබූ ප්‍රතිපත්ති ධනේශ්වර ක්‍රමය යටතේ ක්‍රියාවට නැගිය නොහැකි බවයි. ධනවාදය පදනම් වී පවතින නිෂ්පාදන මාධ්‍යයන්ගේ පෞද්ගලික හිමිකාරිත්වය සහ පිලිමල් ජාතික රාජ්‍ය පද්ධතිය පොදු සමාජ අභිලාෂ සහ අවශ්‍යතා මත පදනම් වූ ඕනෑම තාර්කික ප්‍රතිපත්තියක් බැහැර කරයි. ප්‍රධාන අධිරාජ්‍යවාදී බලයන්, විශේෂිතව ම එක්සත් ජනපද සහ යුරෝපය කාලගුන විපර්යාසය පිලිබඳ ප්‍රශ්නය ඔවුන්ගේ ම දේශපාලන සහ ආර්ථික අභිලාෂයන් පිලිබිඹු වන න්‍යාය පත්‍රයක් පැනවීම පිනිස යොදා ගනිමින් සිටී.

නොවැලැක්විය හැකි පරිදි නව යුද්ධයන්ට, සමාජ කාලකන්නි භාවයට සහ පාරිසරික විනාශයට මග පෙන්වනු ලබන මෙම ස්වයං විනාශකාරී ප්‍රතිපත්තිය නැවැත්වීමට, වඩාත්ම රැඩිකල් ආකාරයේ විරෝධතාවයන්ට පවා නොහැකි වී තිබේ. එකම අව්‍යාජ විසඳුම ඇත්තේ, කාලගුන විනාශයෙන් පරිසරය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය සියලු ක්‍රියාවලීන් ඇතුලුව, මානුෂීය අවශ්‍යතාවයන්ට අනුව සමාජය සහ ලෝකය පුරා නිෂ්පාදනය තාර්කිකව ප්‍රතිසංවිධානය කිරීමට, සමාජවාදී වැඩපිලිවෙලක පදනම මත ජාත්‍යන්තර කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීම මත පමනි.

ඩීට්මාර් හෙනින්ග්

© www.wsws.org